2024

පටුන

දිස්ත්‍රික් ලේකම්ගේ පිළිගැනීම 1-2

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කළමනාකරණය 3-4

01. ආයතනයේ විස්තර

1.1 කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හඳුන්වා දීම 5

1.1.1 පරිපාලන මායිම් 5

1.1.2 ඓතිහාසික වැදගත්කම් 6

1.1.3 ස්වාභාවික සම්පත් 6

1.1.4 වාණිජ හා ආර්ථික කටයුතු 6

1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම මෙහෙවර ක්‍රියාකාරකම් 7

1.2.1 ප්‍රධාන කාර්යයන් 8

1.3 කාර්යක්ෂමතවයෙන් ක්‍රියාකාරකම් 8-9

1.4 දිස්ත්‍රික් කාර්යාලයේ පිහිටීමේ සිතියම 10

1.5 දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ; 11

1.5.1 ජනගහණ තොරතුරු 11

1.5.2 දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යා ලේඛණ තොරතුරු 11

02. .

2.1 විශිෂ්ඨ ජයග්‍රහණ හා ඉදිරි දැක්ම 12-16

2.2 ග්‍රාම සංවර්ධන සේවාවන් 17-18

2.3 පරිවාස හා ළමාරක්ෂක සේවාවන් 18-19

2.4 කාන්තා ළමා කටයුතු හා සමාජ බලගැන්වීමේ **සේවාවන්** 19

2.5 කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයේ **සේවාවන්** 20-25

2.6 ජාතික ආපදා සහන **සේවාවන්** 25-26

2.7 අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු 26-28

2.8 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් **සේවාවන්** 28

2.9 කර්මාන්ත කේෂ්ත්‍ර **සේවාවන්** 29

2.10 අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ **සේවාවන්** 30-31

2.11 සංස්කෘතික කටයුතු **සේවාවන්** 31-32

2.12	සංගණන හා සංඛ්‍යා ලේඛණ සේවාවන්	32-33
2.13	සැලසුම් අංශයේ කටයුතු	33-37
2.14	දිස්ත්‍රික් ආපදා කලමනාකරණ සේවාවන්	38-39
2.15	සමාජ සේවා	40-42
2.16	කෘෂිකර්ම සේවා	42-44
2.17	මෝටර් ප්‍රවාහන සේවාවන්	44
2.18	දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සේවාවන්	45-46
2.19	සමෘද්ධි සංවර්ධන සේවාවන්	46
2.20	භාෂා සංවර්ධන සේවාවන්	47
2.21	ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලන සේවාවන්	48
2.22	මුල්‍ය සේවා	49-50

03. 2024 දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	51
3.2	**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**	52
3.3	**මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**	53
3.4	**මූල්‍ය ප්‍රකාශ සටහන්**	54-77
3.5	**ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය**	78
3.6	**වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය**	79
3.7	**වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරකම්**	79-87
3.8	**මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**	88
3.9	**විගණකාධිපතිවරයාගේ වාර්තාව**	89-97

04. කාර්යසාධන කේතය

4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	98

05. තිරසර සංවර්ධන ඉලක්ක

5.1	හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන ඉලක්ක	99
5.2	**තිරසර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ හා අභියෝග**	99-101

06. මානව සම්පත් පැතිකඩ

6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	102
6.2	ආයතනයේ මානව සම්පත් කාර්ය සාධනය	103

07.අනුකූලතා වාර්තා

1.	මූල්‍ය වාර්තා හා ගිණුම් ඉදිරිපත් කිරීම	104
2.	පොත් පත් හා ලේඛණ නඩත්තු කිරීම; (මු.රෙ 445)	104
3.	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)	105
4.	වාර්ෂික සැලස්ම සකස් කිරීම	105
5.	විගණන විමසුම	106
6.	අභ්‍යන්තර විගණනය	106
7.	විගණන හා කළමනාකරණ කමිටු	106
8.	දේපළ කළමනාකරණය	106
9.	වාහන කළමනාකරණය	107
10.	බැංකු ගිණුම් කළමනාකරණය	107
11.	මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය	107
12.	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	108
13.	පොදු තැන්පත් ගිණුම	108
14.	අක්මුදල් ගිණුම	108
15.	ආදායම් ගිණුම	108
16.	මානව සම්පත් කළමනාකරණය	109
17.	මහජනයා වෙත තොරතුරු ලබාදීම	109
18.	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම	109
19.	මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම	110
20.	විගණන ඡේද සඳහා වන වගකීම්	110

දිස්ත්‍රික් ලේකම්වරයාගේ පිළිගැනීම

2024 වර්ෂය සඳහා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම අතිශයින් සතුටු වෙමි. දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනය අරමුණු කරගනිමින්, 2024 දී විවිධාංගීකරණය වූ අයවැය සහ ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම හරහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු. 600,000 ක් වටිනා නිවාස 9 ක්ද සහ රු. 1,000,000 ක් වටිනා නිවාස 30 ක්ද ප්‍රතිලාභීන්ට ලබා දුන් අතර, ජල හා විදුලි සම්බන්ධතා සහ යටිතල පහසුකම් ව්‍යාපෘති රැසක් ද සිදු කර තිබීම කැපී පෙනෙන ලක්ෂණයකි. 2024 වන වසරේදී "උරුමය" ජාතික වැඩසටහන යටතේ ජනතාවට නොමිලේ ඉඩම් දීමනාපත්‍ර 2405 ක් නිකුත් කරන ලදී.

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ගොඩනැගිලි සටහන්කරණයසහ ජන සංගණන කටයුතු සාර්ථකව නිම කළේය. මීට අමතරව, හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා ආපදා කළමනාකරණ ඒකකය ක්ෂණික හා අවශ්‍ය ආපදා අවදානම් අවම කිරීමේ පියවර ගැනීම සහ 2024 වයඹ දිග මෝසම් වැසි අතරතුර ඇති වූ ගංවතුර ව්‍යසනයෙන් පීඩාවට පත් ජනතාවට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය හරහා සහ රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඇතිව අවශ්‍ය සහන ලබා දීම සැලකිය යුතු කරුණකි.

2024 ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ කටයුතු හොඳින් සංවිධානය කර, ඡන්දදායකයින් 100,907 ක් සිටින කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සිදු කරන ලදී. තවද, කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයෙන් 5S සහතිකය සඳහා අයදුම් කර එය ලබාගෙන ඇති අතර, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඵලදායිතා වැඩිදියුණු කිරීමට අදාළ කටයුතු අඛණ්ඩව සිදු කෙරේ. පාර්ලිමේන්තුව විසින් පවත්වන ලද කාර්ය සාධන දර්ශක ඇගයීම ද දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර විශිෂ්ට ආකාරයකින් සිදු කරන ලදී.

නවීකරණය කරන ලද කාර්යාල මෙහෙයුම් තුළින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතර මහජනතාවට කැපවූ සේවාවන් සපයන අතර ජනතාවගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සහ දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනය සඳහා ඉලක්ක කර කටයුතු කරමින් සිටී. ඒ සම්බන්ධයෙන්, 2024 දී මේ සඳහා දායක වූ සියලුම පාර්ශ්වකරුවන්ට මගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි.

S.Muralitharan
Government Agent/
District Secretary (Acting)
Kilinochchi District.

එස්. මුරලිදරන්,

දිසාපති/දිස්ත්‍රික් ලේකම් (වැඩබලන),

කිලිනොච්චි දිස්ත්‍රික්කය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කළමනාකරණය - 2024



දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කළමනාකරණය - 2024

District Secretary (Acting)
Mr.Subramaniyam Muralitharan
SLAS I, MA in POP Devt, LLB

Addl. District Secretary (Land)
Mrs. Nalagene Inparaj
SLAS I, MA in PA

Director of Planning (Acting)
Mr. Krishnar Sribaskaran
SLPS I, B.A (Hons), MA in RP, Dip in SNLOP

District Director of Agriculture
Mr. Arulampalam Selvarajah
SLAgS, B.Sc in Ag (Hons), M.Sc in NRM

Asst. District Secretary
Mrs. Saththijajeevitha Hariramanan
SLAS III, B.Sc,

District Engineer
Mr. Kamalanathan Divakar
SLES III, B.E, M.E, AMIE (SL)

Director of Samurthi
Mr.Saravanabavan Mohanabavan
SLPS I, B.A

District Register
Mrs. Susitha Thivakaran
B.Sc (Hons)

Mr. Iyathurai Pirem
B.A (Hons)

Chief Accountant
Mr. Sivagnanam Kajenthiran
SLACS I, BBA(Spl)Hons, PGDM, Dip in Eng,Dip in Proc, MBA, CPFA, CIPFA(UK)

Chief Internal Auditor
Mrs. Kumuthini Niranjan
SLACS I, B.Com.

Accountant (Acting)
Mr. Vadivel Suthakaran
SLACS II, BBA, MBA

Asst. Director of Planning
Mr. Amarasingam Ketheeswaran
SLPS III, B.A(Hons) M.Phil in Ec, Dip in Pl,

District Statistician
Mr. Sivanantham Jeyavinthan
SL I

District Director of DMC (Acting)
Mr. Sinniah Kokularajah
M.Sc


Administrative Officer
Mrs. Arunthavarani Manikkarasa
MSO-Supra

01. ආයතනයේ විස්තර

1.1 කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හඳුන්වා දීම.

1.1 පරිපාලන මායිම්

උතුරු පළාතේ මධ්‍යයේ පිහිටා ඇති කිලිනොච්චි දිස්ත්‍රික්කය, උතුරු දිසා මායිම ලෙස යාපනය දිස්ත්‍රික්කයද, නැගෙනහිර දිසාව සහ දකුණු දිසාව මුලතිව් දිස්ත්‍රික්කයෙන් සහ බටහිර දිසාව සහ දකුණු දිසාව ලෙස මන්නාරම් දිස්ත්‍රික්කයෙන් ද මායිම් වේ.



1.1.2 ඓතිහාසික වැදගත්කම්

ශ්‍රී ලංකාවේ පළමුවන මානව ජනාවාසයේ ආරම්භන සළකුණ ලෙස ඉරණමඩු ප්‍රදේශය හඳුනා ගැනීම මඟින් කිළිනොච්චි දිස්ත්‍රික්කයේ පෞරාණිකත්වය පටන් ගනු ලැබෙයි. යාපනය දිස්ත්‍රික්කය සමඟ එක්ව දක්නට තිබූ කිලිනොච්චි ප්‍රදේශය නව දිස්ත්‍රික්කයක් ලෙස 1984 වර්ෂයේ පිහිටුවනු ලැබුවේය.එම කාල වකවානුවේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වාසය කළ ජනතාවන් කෘෂිකර්මය,දඩයම් කිරීම,ධීවර කටයුතු සහ සත්ව පාලනයද සිදු කර ගෙන ගිය අතර ඒය ගබඩා කර තැබීමේ පළ පුරුද්දද ඇති අයවලුන්වූහ.

මෙම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ඉරණමඩු වැව ඇතුළු මහා වාරිමාර්ග වැව් සතරක්ද මධ්‍යම වාරිමාර්ග ගණයට අයත් වැව් පහක්ද කුඩා වාරිමාර්ග වැව් 394 ක්ද මෙම දිස්ත්‍රික්කයේ පිහිටා තිබීම මඟින් ජනතාවන්ගේ ජීවනෝපාය ක්‍රමයන් පිළිබිඹු කරයි. තවද තාක්ෂණය හා කලාත්මකභාවයෙන් යුතු ජන සමූහයක් මෙම ප්‍රදේශයේ විසූ බව විශ්වාස කරනු ලැබේ.

මෙම දිස්ත්‍රික්කයේ ඓතිහාසික වැදගත්කමකින් යුතු උරුත්තිරපුරම් සිවන් කෝවිල, පුලියම්පොක්කනෙ නාගතම්බිරාන් කෝවිල, මන්නිත්තලෙ ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන් කිතුණු දේවස්ථානය, පාලෙත්තීවු ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන් කිතුණු දේවස්ථානය හා පොන්නාවෙලි සිවන් කෝවිල ආදිය සමඟ පූනකරි ඕලන්ද බලකොටුව ආදියද දක්නට තිබේ.

1.1.3 ස්වාභාවික සම්පත්

ස්වාභාවික සම්පත් ලෙස ඉරණමඩු වැව, චුණ්ඩික්කුලම කුරුළු අභය භූමිය, වන්නේරික්කුලම් කුරුළු අභය භූමිය හා ගෞදාරිමුනෙ මුහුදු වෙරළද දැකිය හැකියි.

1.1.4 වාණිජ හා ආර්ථික කටයුතු

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවන්ගෙන් බහුතරයක්ම වී ගොවිතැන සමඟ ධාන්‍ය වගා කිරීමේ කටයුතුවල හා සත්ව පාලනය, පළතුරු වගාව සහ ධීවර රැකියාවෙහිද නිරතව සිටිති.

1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම මෙහෙවර ක්‍රියාකාරකම්

දැක්ම

නවීකරණය කරන ලද දිස්ත්‍රික් පරිපාලනය මඟින්ඵලදායිතාවයෙන් යුතු මහජන සේවයක් ලබාදීම

අරමුණු

රජයේ ප්‍රතිපත්ති අනුව කාර්යක්ෂමතාවය උපයෝගී කර ගනිමින් විශිෂ්ඨසම්බන්ධීකරණයක් මඟින් දිස්ත්‍රික්කයේ සංවර්ධන හා සමාජසංස්කෘතික සාරධර්ම ඉහළ නැංවීම

මෙහෙවර

1. අපක්ෂපාති අවංක ඵළදායිතාවයෙන් යුතු සේවාවක් ලබාදීම
2. එකම තනතුරු තත්වයකසිටින සියළු සේවකයන් සමව ගරු කරනු ලබන අතර

1.2.1 ප්‍රධාන කාර්යයන්

දත්ත විද්‍යුත්කරණය කිරීම මගින් පහසු මහජන සේවාවක් ක්‍රියාත්මක කිරීම

- කාර්යක්ෂමතාවයෙන් යුතු සම්පත් උපයෝගිතාවය
- සේවාලාභීන් හා සම්පත්වල ඵලදායිතාවය ඉහළ මට්ටමකට ගෙන යාම
- පරිසර හිතකාමී නිෂ්පාදන භාණ්ඩ භාවිතා කිරීම
- ජනතාවන්ට පහසු හා කාර්යක්ෂමතාවයෙන් යුතු සේවාවක් ලබාදිය හැකි අයුරෙන් කාර්යාලය සිත් ආකර්ශනය වන අයුරෙන් හා රඳා පැවතීමේ තත්වයට ගෙන ඒම
- දිස්ත්‍රික්කයේ ජනතාවන්ගේ ජීවනතත්වය ජාතික ජීවනතත්වයට සමානව ඉහළ නැංවීම.
- සමෘද්ධි යටිතල ඉදිකිරීම් ප්‍රවර්ධනය, රැකියා අවස්ථාවන් වැනි ක්‍රියා සැළසුම් හරහා දිළිඳුකම හැකි තරම් අඩු කිරීම
- ජීවනෝපාය ආධාර මඟින් පූර්ණ ආදායම් මට්ටම තහවුරු කිරීම
- ආයතනය සඳහා වන විකල්ප කළමනාකරණයක් ගොඩනැංවීම
- ආයතනයේ තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම.
- තිරසාර සංවර්ධන මට්ටම අඛණ්ඩව වැඩිදියුණු කිරීම

1.3 කාර්යක්ෂමතාවයෙන් යුතු ක්‍රියාකාරකම්

කාර්යක්ෂමතාවයෙන් යුතු දිස්ත්‍රික් පරිපාලන ක්‍රමය

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර පරිගණක ජාල සම්බන්ධ කිරීම අභ්‍යන්තර පරිගණක ජාල ක්‍රමයන් හා බාහිර ජාලයන්ද පිහිටුවීම.
- නිළධාරීන් සම්බන්ධව වන පුද්ගලික ලිපි ගොනු පවත්වා ගෙන යාම,වැටුප් හා වෙනත් දීමනා,දුම්රිය ගමන් බලපත්‍ර ලබා දීම හා නිළධාරීන්ගේ නිළයන්ට අවශ්‍ය වන අයුරෙන් පුහුණු ලබාදීම.
- විශ්‍රාමික නිළධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට ඇවැසි කටයුතු සිදුකිරීම.

පිවිතුරු පොදු සේවාවන් ග්‍රාම,ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ජනතාවන්ට ලබා දීම හා ලබා ගැනීම තහවුරු කර ගැනීම.

- ජාතික හැඳුණුම් පත්,මෝටර් රථ වාහන බදු,ව්‍යාපාර ලියාපදිංචිය ආදිය ලබාදීම.
- උප්පැන්න,විවාහ හා මරණ ලියාපදිංචි ප්‍රමාදයෙන් තොරව සිදුකිරීම හා ඒවායේ පිටපත් ලබාදීම
- රියදුරු බලපත්‍ර ලබාදීම
- ඉඩම් බලපත්‍ර ලබාදීම සඳහා කටයුතු සළසාදීම හා ඉඩම් ගැටළු විසඳීම
- සංස්කෘතික සිරිත් විරිත් හා ශාරීරික හා මානසික යහපැවත්ම
- කලා හා සංස්කෘතික උත්සව පැවත්වීම හා කලාව හා සංස්කෘතිය හා සබැඳි තරඟ පැවත්වීම


- සංස්කෘතිය හා සබැඳි ක්‍රීඩා උත්සව පැවත්වීම.
- දිස්ත්‍රික් ක්‍රීඩා උත්සව හා ආබාධිත අයවලුන් සඳහා වන ක්‍රීඩා උත්සව පැවත්වීම
- යහපත් පුරවැසියන් බිහිකිරීමට හැකිවනසේ ළමුන්ට හා තරුණයින්හට දැනුවත් කිරීමේ වැඩමුළු පැවත්වීම සහ උපදේශන ප්‍රවර්ධන වැඩ සටහන් පැවත්වීම.

ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ සිටින ජනතාවන්ගේ අධ්‍යාපන,සෞඛ්‍ය හා කෘෂිකර්ම කටයුතු ආදියට උපකාර කරන අතර දිළිඳු මට්ටම තුළ සිටින අයවලුන්ට සහනාධාර හා ජීවනාධාර උපකාර ලබාදීම.

- කාන්තා මූලිකත්වය දරණ පවුල්වලට ස්වයං රැකියා පුහුණු ලබාදීම හා දිරි දීමනා ලබාදීම.
- වැඩිහිටියන්ට හා ආබාධිත අයවලුන්හට සහ විශේෂිත රෝගී තත්වයේ පසුවන අයවලුන්හට දීමනා ලබාදීම
- ආපදා කළමනාකරණ සේවා ඒකකය විසින් ග්‍රාමීය මට්ටමේ හදිසි ආපදා හා සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩමුළු පැවත්වීම හා ඒම අවස්ථාවේම ආපදා සහන සේවාවන් ක්‍රියාත්මක කිරීම
- ඡන්ද නාම ලැයිස්තු ලියාපදිංචි කටයුතු සිදු කිරීම හා මැතිවරණ සම්බන්ධීකරණය
- ගොවියන්ට අවශ්‍ය බීජ,යෙදුම් ද්‍රව්‍ය හා කෘෂි උපකරණ ලබා දීම

මාර්ග සංවර්ධන,වාරිමාර්ග,විදුලි පහසුකම් සළසා දීම හා නිවාස යෝජනා ව්‍යාපෘති කටයුතු සැකසීම හා යුද්ධයෙන් පීඩාවට පත්වූ අයවලුන්හට වන්දි මුදල් ලබාදීම හා දිස්ත්‍රික්කයේ සියළුම සංවර්ධන කටයුතු සංවිධානය කර නියාමනය කිරීම

1.4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටීම දක්වන සිතියම



1.5 දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	ග්‍රාම නිළධාරී වසම්
කරච්චි	42
කණ්ඩාවලෙ	16
පූනකරි	19
පච්චිලෙප්පල්ලි	18

1.5.1 ජනගහණ තොරතුරු

අංක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	පවුල් සංඛ්‍යාව	සම්පූර්ණ පුද්ගලයින් සංඛ්‍යාව	පිරිමි	ගැහැණු	දෙමළ	සිංහල	මුස්ලිම්
01	කරච්චි	27,727	79,033	38,113	40,920	78,081	93	859
02	කණ්ඩාවලෙ	9,555	28,091	13,672	14,419	28,063	2	26
03	පූනකරි	8,686	28,240	14,116	14,124	26,526	8	1706
04	පච්චිලෙප්පල්ලි	4,939	15,027	7,371	7,656	14,977	24	26
එකතුව		**50,907**	**150,391**	**73,272**	**77,119**	**147,647**	**127**	**2,617**

1.5.2 දිස්ත්‍රික්කයේ මූලික සංඛ්‍යා ලේඛණ තොරතුරු

දිස්ත්‍රික්කය	කිලිනොච්චිය
පළාත	උතුර
මුළු භූමි ප්‍රමාණය	1279 sqkm
ග්‍රාම නිළධාරී වසම් සංඛ්‍යාව	95
ගම්මාන සංඛ්‍යාව	354
ජන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව	108
ප්‍රාදේශීය සභා සංඛ්‍යාව	03
කළාප අධ්‍යාපන කාර්යාල සංඛ්‍යාව	02
පාසල් සංඛ්‍යාව	104
අධ්‍යාපනය හැදෑරන සිසුන් සංඛ්‍යාව	21,457
ගුරුවරුන් සංඛ්‍යාව	1,473
ජනගහණය	150391

02. වැඩි දියුණු කිරීම හා ඉදිරි දැක්ම

2.1 විශිෂ්ඨ ජයග්‍රහණ හා අභියෝග

ජාතික මට්ටම

2022 කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර පවත්වන ලද ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇගයීම 2022 සම්මාන ප්‍රදානෝත්සවය 2023. කිලිනොච්චිය දිස්ත්‍රික් දිසාපති එස්. මුරලීදරන් මහතාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සම්මන්ත්‍රණ ශාලාවේදී මෙම උත්සවය පැවැත්විණි.

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI) ඇගයීමේදී, "මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, සැලසුම්කරණය සහ විගණනය යන ක්ෂේත්‍රවල දර්ශක 131 ක් තක්සේරු කරන ලදී." විශේෂයෙන්ම මහජන සේවා, සේවා ප්‍රඥප්තිය, තොරතුරු දැනගැනීමේ අයිතිය, සංවර්ධන කටයුතු, මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම, වත්කම් හෙළිදරව් කිරීම, පාඩු කළමනාකරණය, නිලධාරීන් මාරු කිරීම, ගිණුම් ඉදිරිපත් කිරීම, වාර්තා පවත්වාගෙන යාම, අධිකාරිය පැවරීම, වැටුප් පැකේජ කළමනාකරණය, මෙහෙයුම් සැලසුම් කිරීම, අග්‍රිම කළමනාකරණය, විගණන කටයුතු, බැංකු කටයුතු, නිලධාරීන්ගේ ණය නඩත්තුව, ගිණුම් නඩත්තු කිරීම, ප්‍රතිපාදන හා වියදම්, උප අරමුදල්, ආදායම් ගිණුම් කළමනාකරණය සහ වාර්ෂික ක්‍රියාකාරකම් වාර්තා ඇතුළුව දර්ශක 126 ක් ප්‍රධාන මෙහෙයුම් ප්‍රදේශයේ (MIA) පිහිටුවා තිබීම විශේෂත්වයකි.තැන්පතු ගිණුම් නඩත්තු කිරීම, ප්‍රතිපාදන සහ වියදම්, උප අරමුදල, ආදායම් ගිණුම් කළමනාකරණය සහ වාර්ෂික ක්‍රියාකාරකම් වාර්තා ඇතුළුව දර්ශක (KPI) 131 ක් ප්‍රධාන මෙහෙයුම් ප්‍රදේශයේ තිබීම විශේෂත්වයකි.

මුලතිව් දිස්ත්‍රික් ලේකම් ප්‍රධාන අභ්‍යන්තර විගණක කේ.ලිංගේෂ්වරන්, යාපනය, වේලනයි ප්‍රාදේශීය ලේකම් කේ. සිවකරන්, උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සැලසුම් අධ්‍යක්ෂ එස්.මෝහන්භවන් යන මහත්වරුන් ඉහත කී ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ඇගයීම් කමිටු සාමාජිකයන් ලෙස පත් කර ඇගයීම් සිදු කරන ලදී. ඒ අනුව ලකුණු 93.5 ක් ලබා පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රථම ස්ථානයත්, ලකුණු 92.33 ක් ලබා ගනිමින් කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දෙවන ස්ථානයත් ලබා ගත් අතර ඔවුන් “EXCELLENT ACHIVEMENT“ සම්මානයෙන් පිදුම් ලැබීය.

එමෙන්ම ලකුණු 87 ක් ලබාගත් කණ්ඩාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතර වැනි ස්ථානය ලබා “GOOD ACHIVEMENT “ සහතිකපත්‍රවලින් ගෞරවාදරයට පත් විය. ලකුණු 81.83 ක් ලබාගත් කරච්චි

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පස්වැනි ස්ථානයත් ලබා ““AVERAGE ACHIVEMENT” සහතිකපත්‍රවලින් ගෞරවාදරයට පත් විය.

කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ජාතික මට්ටමේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) තරගයට සහභාගි වී ජයග්‍රහණය කිරීමට දිරිගැන්වීම සඳහා එකී තරගය පවත්වනු ලැබීම විශේෂත්වයකි.

Summary of Key Performance Indicators - 2023

Part I	Total	Karaichchi	Kandawalai	Pachchilaipalli	Poonakari	Kachcheri
A- Annual Final Statements	8	0	8	8	8	8
B - Registers	35	30.5	29	34	34.5	33
C - Delegation of Authority	5	4	4.5	5	5	5
D - Pay Roll	15	7	14	15	15	15
E - Action Plan & Procurement Activity	9	9	9	9	9	8
F - Imprest	7	6.5	6.5	7	6.5	7
G - Audit	13	13	12.5	12.5	12.5	12
H - Assets Management	20	20	19	19	19	14
I - Vehicle Management	12	11	11.5	11	8	11
J - Banking Activities	10	10	10	10	10	10
K - APOO	15	12	15	15	15	15
L - Deposit Account	14	14	14	14	14	14
M - Allocation	12	9	10	8	11	10
N - Ad hoc Advance	4	4	4	4	4	3
O - Revenue Management	5	5	5	5	5	5
P - Performance Report	6	3	3	3	5	6
Q - Cadre & Duty	10	8.5	9	9	8	10
மொத்தப்புள்ளிகள்	**200**	**166.5**	**184**	**188.5**	**189.5**	**186**

Part II	Total	Karaichchi	Kandawalai	Pachchilaipalli	Poonakari	Kachcheri
A - Informations	15	15	12	14	14	15
B - Development Activities	15	7	7	11.5	15	15
C - Citizen's Charter	4	2	4	2	4	3
D - Human Resource	9	8	6	6	7	9
E - COPA	10	10	10	10	10	10
F - Services	15	12	13	13	12	15
G - Decleration of Assets	10	5	5	10	10	10
H - Losses	8	8	8	8	8	8
I - Tranfers	8	8	8	8	6	0
J - Frauds	0	0	0	0	0	0
K- Meeting	6	4	4	6	5	6
மொத்தப் புள்ளிகள்	**100**	**79**	**77**	**88.5**	**91**	**91**

Part I	200	166.5	184	188.5	189.5	186
Part II	100	79	77	88.5	91	91
Total	**300**	**245.5**	**261**	**277**	**280.5**	**277**
Average		**81.83**	**87**	**92.33**	**93.50**	**92.33**
Rank		**5**	**4**	**2**	**1**	**2**

.....
என்.எஸ்.ஆர்.சிவரூபன்
பிரதம கணக்காளர்
மாவட்ட செயலகம்
யாழ்ப்பாணம்

.....
கை.சிவகரன்
பிரதேச செயலாளர்
பிரதேச செயலகம்
வேலணை

.....
எஸ்.சுபச்செல்வன்
பிரதி திட்டமிடல் பணிப்பாளர்
பிரதேச செயலகம்
பருத்தித்துறை

Approved.

S.Muralitharan
Government Agent/
District Secretary (Acting)
Kilinochchi District.

24/07/2024.

අංක	සම්මානයේ නම	ප්‍රදානය කළ අය	සම්මානය ලබා ගත් වසර	සම්මානය ලබා ගත් දිනය	ස්ථානය
1	ජාතික ඵලදායිතා සම්මාන	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය	2015	14.12.2016	දෙවන ස්ථානය
2	2015 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභාව සඳහා තක්සේරු සැලැස්ම	ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව	2015	13.11.2017	සහතික පිළිගැනීම
3	ජාතික ඵලදායිතා සම්මාන	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය	2018	26.03.2019	ප්‍රථම ස්ථානය
4	දක්ෂ තරුණයින්	ජාතික තරුණ සේවා සංසදය සහ ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය	2018		
5	"තුරුණු ග්‍රාම ශක්ති" ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය	ජාතික තරුණ සේවා සංසදය			
6	සිත්රු 2019	සමාජ සේවා දෙපාර්තමේන්තුව	2019		දෙවන ස්ථානය
7	ජාතික ඵලදායිතා සම්මාන	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය	2020	26.04.2022	ප්‍රථම ස්ථානය
8	Best Annual Reports and Accounts- 2022 in the public sector	Association of Public Finance Accountants of Sri Lanka	2022	14.12.2023	රන් පදක්කම්
9	2021 වන වර්ෂය සඳහා වන KPI කාර්යක්ෂමතාවය ඇගයීම	ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව	2023		සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතර දෙවන ස්ථානය



දිස්ත්‍රික් / පළාත් මට්ටම

අංක	සම්මානයේ නම	දිස්ත්‍රික්කය / පළාත	සම්මානය ලබා ගත් වර්ෂය	ස්ථානය
1	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සුභ සාධන Trophy	දිස්ත්‍රික්කය	2011	ප්‍රථම ස්ථානය
2	සාහිත්‍ය තරඟ	පළාත්	2012	දෙවන ස්ථානය
3	ප්‍රාදේශීය ක්‍රීඩා තරඟ	දිස්ත්‍රික්කය	2014	ප්‍රථම ස්ථානය
4	දිසාපති කුසලානය - 2014, අත් පන්දු (පිරිමි)	දිස්ත්‍රික්කය	2014	දෙවන ස්ථානය
5	දිසාපති කුසලානය - 2014, සැහැල්ලු පන්දු (පිරිමි)	දිස්ත්‍රික්කය	2014	ප්‍රථම ස්ථානය
6	දිසාපති කුසලානය - 2014, පාපන්දු (පිරිමි)	දිස්ත්‍රික්කය	2014	ප්‍රථම ස්ථානය
7	ජාත්‍යන්තර කාන්තා දිනය 2016, බැඩ්මින්ටන්	දිස්ත්‍රික්කය	2016	ප්‍රථම ස්ථානය
8	දිසාපති කුසලානය - 2016, කඹ ඇදීම (ගැහැණු)	දිස්ත්‍රික්කය	2016	දෙවන ස්ථානය
9	"Healthy Lifestyle Challenge Trophy" - 2016, Foot ball	දිස්ත්‍රික්කය	2016	ප්‍රථම ස්ථානය
10	Iranaimadu cup - 2017	දිස්ත්‍රික්කය	2017	Participation
11	දිසාපති කුසලානය - 2017, වෙස් තරඟය (කාන්තා)	දිස්ත්‍රික්කය	2017	දෙවන ස්ථානය

12	දිසාපති කුසලානය - 2017, වෙස් (පිරිමි)	දිස්ත්‍රික්කය	2017	දෙවන ස්ථානය
13	දිසාපති කුසලානය - 2017, කැරම්; (ගැහැණු)	දිස්ත්‍රික්කය	2017	දෙවන ස්ථානය
14	දිසාපති කුසලානය - 2017, බැඩ්මින්ටන් (පිරිමි)	දිස්ත්‍රික්කය	2017	දෙවන ස්ථානය
15	දිසාපති කුසලානය - 2017, බැඩ්මින්ටන් (ගැහැණු)	දිස්ත්‍රික්කය	2017	ප්‍රථම ස්ථානය
16	දිසාපති කුසලානය - 2017, කඹ ඇදීම (ගැහැණු)	දිස්ත්‍රික්කය	2017	දෙවන ස්ථානය
17	වාර්ෂික අන්තර් කේෂ්ත්‍ර අතර ක්‍රිකට් තරඟාවලියක්	පළාත්	2017	Winners
18	දිසාපති කුසලානය - 2018	දිස්ත්‍රික්කය	2018	Overall Runner up
19	දිසාපති කුසලානය - 2018, කැරම් (පිරිමි)	දිස්ත්‍රික්කය	2018	ප්‍රථම ස්ථානය
20	දිසාපති කුසලානය - 2018, කැරම් (ගැහැණු)	දිස්ත්‍රික්කය	2018	ප්‍රථම ස්ථානය
21	දිසාපති කුසලානය - 2018, බැඩ්මින්ටන් (පිරිමි)	දිස්ත්‍රික්කය	2018	දෙවන ස්ථානය
22	දිසාපති කුසලානය - 2018, පාපන්දු	දිස්ත්‍රික්කය	2018	දෙවන ස්ථානය
23	දිසාපති කුසලානය - 2022	දිස්ත්‍රික්කය	2022	දෙවන ස්ථානය
24	දිසාපති කුසලානය - 2022, පැසි පන්දු (ගැහැණු)	දිස්ත්‍රික්කය	2022	දෙවන ස්ථානය
25	දිසාපති කුසලානය - 2022, පාපන්දු	දිස්ත්‍රික්කය	2022	දෙවන ස්ථානය
26	දිසාපති කුසලානය - 2022, අත් පන්දු (පිරිමි)	දිස්ත්‍රික්කය	2022	ප්‍රථම ස්ථානය
27	දිසාපති කුසලානය - 2022, බැඩ්මින්ටන් (පිරිමි)	දිස්ත්‍රික්කය	2022	දෙවන ස්ථානය
28	ප්‍රාදේශීය මට්ටමේ, කාර්ය සාධන දර්ශක සඳහා වන ඇගයීම	දිස්ත්‍රික්කය	2022	Excellence Peformence
29	අන්තර් දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් සඳහා සුහද ක්‍රිකට් තරඟාවලිය	පළාත්	2023	දෙවන ස්ථානය
30	අන්තර් කේෂ්ත්‍ර අතර තරඟ	දිස්ත්‍රික්කය	2023	Overall Champion
31	ප්‍රාදේශීය මට්ටමේ, කාර්ය සාධන දර්ශක සඳහා වන ඇගයීම	දිස්ත්‍රික්කය	2023	
32	මාණ්ඩලික නිලධාරීන් සඳහා වන සැහැල්ලු පන්දු තරඟාවලිය	පළාත්	2024	Participant

2.2 ග්‍රාම සංවර්ධන සේවාවන්

උතුරු පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන කිලිනොච්චි දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු ලෙස පහත දක්වා ඇති දෑ සඳහන් කළ හැකියි.

- කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතරක ග්‍රාම සංවර්ධන සමිති 173 ක්ද කාන්තා ග්‍රාම සංවර්ධන සමිති 164 ක්ද ලියාපදිංචි කර ක්‍රියාත්මක වෙමින් පවතියි. මෙම සියළුම සමිතීන් ග්‍රාමීය මට්ටමේ විශිෂ්ඨ ලෙස ක්‍රියාත්මක වන සමාජ මට්ටමේ සංවිධාන වේ.
- කිලිනොච්චි දිස්ත්‍රික්කයේ රැකියා විරහිතව සිටින ග්‍රාමීය තරුණියන් ස්වයං රැකියාවන්හි දිරි ගැන්වීම සඳහා හාපැසැල් අධ්‍යාපනය අතර මහදී හැර ගොස් රැකියා අවස්ථාවන් සොයා ගැනීමට නොහැකිව සිටින කාන්තාවන්ට උපකාර වන අරමුණෙන් කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවා කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයේ උපදේශක හරහා ග්‍රාමයන්හි කාන්තාවන් හා සබැඳි නොයෙක් වර්ගයේ ඇඳුම් නිර්මාණය,අත්කම්,ගෘහ ආර්ථිකය,සෞන්දර්ය පුහුණු ලබා දෙනු ලැබේ.
- කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි, කණ්ඩාවලෙ> පූනකරි, පච්චිලෙප්පල්ලි ආදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක වන කාන්තා සංවර්ධන මධ්‍යස්ථානවල සිසුන් 20 දෙනෙක් බැගින් සිසුන් 80 දෙනෙක් පුහුණුව ලබා පිටත් වී ඇත. මෙම අයවලුන්හට මාස 12 න් යුතු ගෘහ ආර්ථික ඩිප්ලෝමා පාඨමාලාව යන මැයෙන් පුහුණුව ලබා දෙනු ලැබුවේය. සෑම සිසුවෙකුටම දිනකට දිරි දීමනාව ලෙස රුපියල් 300.00 ක මුදලක් ලබාදෙනු ලැබුවේය. පුහුණුව අවසානයේ සියළුම ප්‍රාදේශීය කොට්ඨාශවල විභාග පවත්වා, අවසානයේ ප්‍රාදේශීය හා පළාත් මට්ටමෙන් ප්‍රදර්ශනයක්ද පවත්වනු ලැබුවේය.
- උතුරු පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවි ක්‍රම (Web Based Informetion System) මඟින් අවශ්‍ය කරුණු ලබා ගැනීමේ පහසුකම් සිදු කර ක්‍රියාත්මක කර ඇත.

1. ප්‍රාදේශීය වශයෙන් වන යාවත්කාලීන කිරීම්
2. සම්බන්ධවීම සඳහා වන විස්තර
3. ලියාපදිංචි සමිති (Registered Society).
4. ලියාපදිංචි සමිතිවල පරිපාලන විස්තර (Committee Details for Registered Society)
5. ලියාපදිංචි සමිතිවල දේපළ විස්තර
6. සමිතිවල හා සමිති සාමාජිකයින්ගේ ස්තරම් නිෂ්පාදන පිළිබඳ තොරතුරුවල විස්තර.
7. දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති ග්‍රාමීය කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිවල අංකය සමඟ විස්තර ලියාපදිංචි අංකය.
8. යාවත්කාලීන කළ හැකි පහසුකම්.
9. ව්‍යවස්ථා රීති.
10. පුහුණු අයැදුම්.
11. ලියාපදිංචි සහතිකය.
12. දෙපාර්තමේන්තු චක්‍රලේඛ.

ව්‍යාපෘතීන්	ස්ථානය	ප්‍රතිපාදන
නව පාලමක් ඉදිකිරීම	මායවනූර්	මිලියන 1.5 ක්
නව පාලමක් ඉදිකිරීම	පුන්නෙනීරාවි	මිලියන 1.5 ක්
පාලමක් ඉදිකිරීම	මුරසුමෝට්ටයි	මිලියන 4 ක්
	එකතුව	මිලියන 7

2.3 පරිවාස හා ළමාරක්ෂක සේවාවන්

➢ දිස්ත්‍රික් ලමා සංවර්ධන කමිටු සාකච්ඡාව

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ලමුන් හා කටයුතු කරන නිළධාරීන් සමඟ දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් ලමුන්ගේ සංවර්ධනය සම්බන්ධයෙන් කාර්තුවකට එක් සාකච්ඡාවක් බැගින් සාකච්ඡා තුනක් පවත්වන ලදී. එක් සාකච්ඡාවකට රුපියල් 3500/- බැගින් ප්‍රතිපාදන 14000/- ක් ලැබී රුපියල් 10500 /- ක් වැය කරන ලදී.

1 වන කාර්තුව - - 20/03/2024

2 වන කාර්තුව - 06/08/2024

3 වන කාර්තුව - 04/12/2024





➢ දිස්ත්‍රික් ලමා සභා රැස්වීම්

දිස්ත්‍රික් ලමා සමාජයේ සාමාජිකත්වය දරන ලමුන් සමඟ සාකච්ඡා තුනක් පවත්වන ලදී. ඒක් සාකච්ඡාවකට රු. 10000/- ක් බැගින් රු. 30000/- ක් ලැබී වැය කරන ලදී.

පලමුවන සාකච්ඡාව - 17/05/2024

දෙවන සාකච්ඡාව - 23/08/2024

තුන්වන සාකච්ඡාව - 06/12/2024







➢ **දිස්ත්‍රික් මාසික ප්‍රගති සාකච්ඡා**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවය කරන ළමා හිමිකම් සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් මෙම වසරේ සාකච්ඡා 12 ක් පවත්වන ලදී. මාසයක සාකච්ඡාව සඳහා රු. 3000 බැගින් රු. 36,000 ක මූල්‍ය ප්‍රතිපාදනයක් ලැබුණු අතර රු. 35,700 ක වියදමක් දැරීමට සිදුවිය.

➢ **ලෝක ළමා දින උත්සවය**

2024 වසර සඳහා ලෝක ළමා දින උත්සවය 2024/10/22 දින දිස්ත්‍රික් කුසලතා සංවර්ධන ශාලාවේදී පැවැත්වේ. මෙම අවස්ථාවට ළමුන් 150 ක් සහභාගී වූහ. මෙම උත්සවය සඳහා රු. 10,000 ක් වෙන් කරන ලද අතර වියදම ද දරන ලදී.





2.4 කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ සේවාවන්

අංක	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ව්‍යාපෘති ක්‍රියාකාරකම්	ප්‍රතිපාදන
01	සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල	ජාතික කාන්තා ලේකම් කාර්යාලයේ කාන්තා ගෘහමූලික පවුල් සවිබල ගැන්වීමේ වැඩ සටහන්	1,000,000
02	පූනකරි ,පච්චිලයිපල්ලි	දිරිය අමන්පත්ත වැඩ සටහන	500,000
03	පච්චිලයිපල්ලි, කන්ඩාවලෙයි	ක්ෂුද්‍ර මූල්‍ය ණය ප්‍රශ්න හේතුවෙන් පීඩාවට පත්වූ කාන්තාවන් සඳහා වන ජීවනාධාර ආධාර	300,000
04	කරච්චි	ජීවනාධාර ආධාර	100,000
05	පච්චිලයිපල්ලි	උපදේශන දැනුවත් කිරීම්	30,000
06	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල	හදිසි ආධාර	25,000
07	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ලිංගික අපචාර හේතුවෙන් පීඩාවට ලක්වී ඇති පුද්ගලයින් සඳහා වන සේවාවන් සපයන පුද්ගලයන්ට සේවා සපයන හවුල්කරුවෙකු සමඟ සාකච්ඡා කිරීම	264,500
08	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ප්‍රදර්ශනය හා අළෙවිය	79,500

2.5 කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයේ සේවාවන්

තරුණ තරුණියන්ගේ ව්‍යවසාය හැකියාවන් හා ඵලදායිතා තත්ත්වයන් වර්ධනය කිරීම මගින් රැකියා බිහිකිරීම් වැඩිකර නම් රටේ ආර්ථික ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින්ගේ උච්චතම අවස්ථාවන් ලබාදීමේ අරමුණෙන් කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය පහත සඳහන් ඒකක මඟින් ව්‍යාපෘතින් කීපයක්ම ක්‍රියාත්මක කරමින් සිටියි.

01. ව්‍යවසාය සංවර්ධන අංශය
02. වෙළඳපොල සංවර්ධන අංශය
03. මුල්‍ය හා උපකාර සේවා අංශය
04. තාක්ෂණික හා නව නිපැයුම් අංශය
05. ව්‍යාපාර උපදෙස් සේවා අංශය
06. පර්යේෂණ හා සංවර්ධන අංශය

ඉහත අංශ මඟින් ව්‍යවසාය අවස්ථාවන් හඳුනා ගැනීම, ව්‍යාපාරික ගැටළු නිරාකරණය කිරීම, වෙළඳපොල අවස්ථාවන් හඳුනා ගැනීම, පුහුණුව ලබාදීම හා ව්‍යාපාර වර්ධනය කිරීම පිළිබඳ ව්‍යවසායකයින්ගේ සුභසාධන හා සබැඳි නොයෙක් ව්‍යාපෘතීන් කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

අංක	වැඩ සටහනේ නම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	දිනය
1	ව්‍යවසායකයින් සංගමය අළුත් කිරීම	දිස්ත්‍රික් කාර්යාලය	03.07.2024
2	මාසික පොළ	කරච්චි	03.26.2024
3	මාසික පොළ	පූනකරි	03.26.2024
4	ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	කරච්චි	03.13.2024
5	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	කරච්චි	03.20.2024
6	ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	පච්චිලෙප්පල්ලි	03.22.2024
7	පිරිවැය විශ්ලේෂණය	පච්චිලෙප්පල්ලි	03.27.2024
8	ගිණුම් ලියාපදිංචි කිරීම	පච්චිලෙප්පල්ලි	03.28.2024
9	සමාජ මාධ්‍ය මඟින් ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	කරච්චි	03.20.2024
10	සමාජ මාධ්‍ය මඟින් ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	කරච්චි	03.22.2024
11	ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	පූනකරි	03.21.2024
12	මාසික පොළ	පච්චිලෙප්පල්ලි	03.26.2024
13	ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	කණ්ඩාවලෙයි	03.27.2024
14	සමාජ මාධ්‍ය මඟින් ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	කරච්චි	03.27.2024

15	දිස්ත්‍රික් පොළ	දිස්ත්‍රික් කාර්යාලය	04.05.2024 04.06.2024
16	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	පූනකරි	04.02.2024
17	මාසික පොළ	පච්චිලෙප්පල්ලි	04.10.2024
18	මාසික පොළ	කණ්ඩාවලෙයි	04.08.2024
19	ආහාර ප්‍රදර්ශනය	කණ්ඩාවලෙයි	04.09.2024
20	ගිණුම් ලියාපදිංචි කිරීම	පූනකරි	04.19.2024
21	මාසික පොළ	පූනකරි	04.29.2024
22	පිරිවැය විශ්ලේෂණය	පූනකරි	04.24.2024
23	වාණිජ සැලසුම සකස් කිරීම	පච්චිලෙප්පල්ලි	05.07.2024 05.08.2024
24	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	පූනකරි	04.25.2024
25	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	පූනකරි	05.02.2024
26	සමාජ මාධ්‍ය මඟින් ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	පච්චිලෙප්පල්ලි	05.02.2024
27	පිරිවැය විශ්ලේෂණය	කණ්ඩාවලෙයි	05.08.2024
28	ගිණුම් ලියාපදිංචි කිරීම	කණ්ඩාවලෙයි	05.09.2024
29	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	කරච්චි	05.07.2024
30	මාසික පොළ	කරච්චි	05.27.2024
31	වාණිජ උපදෙස් පිළිබඳ කේෂ්ත්‍ර සංචාරය	කරච්චි	05.31.2024
32	ආහාර ප්‍රදර්ශනය	පච්චිලෙප්පල්ලි	05.13.2024
33	ආහාර ප්‍රදර්ශනය	පූනකරි	05.10.2024
34	වාණිජ උපදෙස් පිළිබඳ කේෂ්ත්‍ර සංචාරය	පූනකරි	05.15.2024
35	මාසික පොළ	පූනකරි	05.16.2024
36	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	පච්චිලෙප්පල්ලි	05.15.2024
37	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	පච්චිලෙප්පල්ලි	05.22.2024
38	මාසික පොළ	පච්චිලෙප්පල්ලි	05.27.2024
39	වාණිජ සැලසුම් සකස් කිරීම	පූනකරි	05.29.2024 05.30.2024
40	මාසික පොළ	කණ්ඩාවලෙයි	05.29.2024
41	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	පූනකරි	06.07.2024

42	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	කරච්චි	06.27.2024
43	කණ්ඩායම් කාර්මික පුහුණුව කිරි ආශ්‍රිත නිෂ්පාදන ද්‍රව්‍ය	කරච්චි	06.04.2024
44	පිරිවැය විශ්ලේෂණය	කරච්චි	06.07.2024
45	ගිණුම් ලියාපදිංචි කිරීම	කරච්චි	06.11.2024
46	කණ්ඩායම් කාර්මික පුහුණුව ආරි කැටයම් වැඩ	කණ්ඩාවලෙයි	06.06.2024 06.07.2024
47	මාසික පොළ	කණ්ඩාවලෙයි	06.24.2024
48	මාසික පොළ	පූනකරි	06.24.2024
49	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	පච්චිලෙප්පල්ලි	06.19.2024
50	මාසික පොළ	පච්චිලෙප්පල්ලි	06.24.2024
51	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	කරච්චි	06.18.2024
52	මාසික පොළ	කරච්චි	06.24.2024
53	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	කරච්චි	06.30.2024
54	ව්‍යවසායකත්ව සංවර්ධන නේවාසික පුහුණු පාඨමාලාව සඳහා තෝරා ගැනීම	කණ්ඩාවලෙයි	06.28.2024
55	මාසික පොළ	පච්චිලෙප්පල්ලි	07.29.2024
56	මාසික පොළ	පූනකරි	07.29.2024
57	මාසික පොළ	කණ්ඩාවලෙයි	07.29.2024
58	ව්‍යවසායකත්ව සංවර්ධන නේවාසික පුහුණු පාඨමාලාව සඳහා තෝරා ගැනීම	කරච්චි	07.23.2024
59	මාසික පොළ	කරච්චි	07.29.2024
60	කණ්ඩායම් කාර්මික පුහුණුව පොල් වගාව සඳහා වන තාක්ෂණය	කරච්චි	0730.2024
61	ව්‍යවසායකත්ව සංවර්ධන නේවාසික පුහුණු පාඨමාලාව සඳහා තෝරා ගැනීම	කරච්චි	07.30.2024
62	ව්‍යවසායකත්ව සංවර්ධන නේවාසික පුහුණු පාඨමාලාව සඳහා තෝරා ගැනීම	කරච්චි	08.05.2024
63	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	පච්චිලෙප්පල්ලි	08.13.2024
64	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	පච්චිලෙප්පල්ලි	08.16.2024
65	ව්‍යවසායකත්ව සංවර්ධන නේවාසික පුහුණු පාඨමාලාව දවස් 12	දිස්ත්‍රික් කාර්යාලය	08.12.2024 08.23.2024
66	මාසික පොළ	කණ්ඩාවලෙයි	08.26.2024
67	මාසික පොළ	පූනකරි	08.26.2024

68	කණ්ඩායම් කාර්මික පුහුණුව Cake Icing	කණ්ඩාවලෙයි	08.29.2024
69	මාසික පොළ	කණ්ඩාවලෙයි	09.02.2024
70	කණ්ඩායම් කාර්මික පුහුණුව Cake Icing	පච්චිලෙප්පල්ලි	09.12.2024
71	කණ්ඩායම් කාර්මික පුහුණුව ආරි කැටයම් වැඩ	කරච්චි	09.12.2024 09.13.2024
72	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	කරච්චි	09.10.2024
73	කණ්ඩායම් කාර්මික පුහුණු පාඨමාලාව තල් ආශ්‍රිත සබන් නිෂ්පාදනය	කරච්චි	09.24.2024
74	මාසික පොළ	පූනකරි	09.20.2024
75	කණ්ඩායම් කාර්මික පුහුණු පාඨමාලාව පොල් කටු ආශ්‍රිත අත්කම් භාණ්ඩ නිෂ්පාදනය	පච්චිලෙප්පල්ලි	09.24.2024 09.25.2024
76	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	පච්චිලෙප්පල්ලි	09.11.2024
77	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	පච්චිලෙප්පල්ලි	09.18.2024
78	මාසික පොළ	කරච්චි	0930.2024
79	කණ්ඩායම් කාර්මික පුහුණු පාඨමාලාව තල් ආශ්‍රිත සබන් නිෂ්පාදනය	පූනකරි	10.02.2024
80	කණ්ඩායම් කාර්මික පුහුණුව	කණ්ඩාවලෙයි	10.04.2024
81	සාරි තාවනි ප්ලීට් සකස් කර නමන ක්‍රමය	කරච්චි	10.08.2024
82	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	කරච්චි	10.10.2024
83	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	පච්චිලෙප්පල්ලි	10.11.2024
84	මාසික පොළ	කරච්චි	10.14.2024
85	වාණිජ මහ පෙන්වීම්	දිස්ත්‍රික් කාර්යාලය	10.15.2024 10.18.2024
86	වාණිජ මහ පෙන්වීම්	කණ්ඩාවලෙයි	10.16.2024
87	කණ්ඩායම් කාර්මික පුහුණුව Liquid hand wash	කරච්චි	10.17.2024
88	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	කරච්චි	10.18.2024
89	ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	කරච්චි	10.22.2024
90	මාසික පොළ	පච්චිලෙප්පල්ලි	10.28.2024
91	ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	පූනකරි	1022.2024
92	වාණිජ මහ පෙන්වීම්	පූනකරි	10.29.2024

93	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	කණ්ඩාවලෙයි	10.30.2024
94	සමූහ ව්‍යාපාර තාක්ෂණික පුහුණු පාඨමාලාව හිසකෙස් උපාංග සහ කරාබු සෑදීම	පච්චිලෙප්පල්ලි	10.23.2024
95	කණ්ඩායම් කාර්මික පුහුණුව (Palmyra product)	කණ්ඩාවලෙයි	10.24.2024 10.25.2024
96	කණ්ඩායම් කාර්මික පුහුණුව	කරච්චි	10.24.2024
97	මාසික පොළ	කරච්චි	10.29.2024
98	කණ්ඩායම් කාර්මික පුහුණුව නියපොතු හැඩ ගැන්වීම	කරච්චි	10.31.2024
99	කණ්ඩායම් කාර්මික පුහුණුව මනමාලි සැරසීම	දිස්ත්‍රික් කාර්යාලය	11.05.2024
100	ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	කණ්ඩාවලෙයි	11.05.2024
101	ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩමුළුව	පච්චිලෙප්පල්ලි	11.06.2024
102	මාසික පොළ	කණ්ඩාවලෙයි	11.25.2024
103	කණ්ඩායම් කාර්මික පුහුණුව පාසල් ඇඳුම් නිෂ්පාදනය	කරච්චි	11.07.2024
104	ව්‍යාපාර සඳහා නීති සහ රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය	පූනකරි	11.19.2024
105	කණ්ඩායම් කාර්මික පුහුණුව අත් විෂබීජ නාශකයක් සෑදීම	කණ්ඩාවලෙයි	11.19.2024
106	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	කරච්චි	11.20.2024
107	කණ්ඩායම් කාර්මික පුහුණුව කේක් අයිසිං	කරච්චි	11.19.2024 11.20.2024
108	අළෙවිය සඳහා වන මහ පෙන්වීම	පච්චිලෙප්පල්ලි	11.13.2024
109	කණ්ඩායම් කාර්මික පුහුණුව සාරි තාවනි ප්ලීට් සකස් කර නමන ක්‍රමය	කණ්ඩාවලෙයි	11.20.2024
110	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	පච්චිලෙප්පල්ලි	11.19.2024
111	මාසික පොළ	පච්චිලෙප්පල්ලි	11.25.2024
112	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	පච්චිලෙප්පල්ලි	11.19.2024
113	කණ්ඩායම් කාර්මික පූහුණුව මනමාලි සැරසීම	පච්චිලෙප්පල්ලි	11.29.2024
114	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	කරච්චි	11.22.2024
115	කණ්ඩායම් කාර්මික පුහුණුව ආරි කැටයම් වැඩ	කණ්ඩාවලෙයි	11.21.2024 11.22.2024
116	කණ්ඩායම් කාර්මික පුහුණුව Cake Icing	කණ්ඩාවලෙයි	11.26.2024 11.27.2024

117	කණ්ඩායම් කාර්මික පුහුණුව ආරි කැටයම් වැඩ	පූනකරි	11.25.2024 11.26.2024
118	කණ්ඩායම් කාර්මික පුහුණුව මහන මැෂින් අලුත්වැඩියාව්	පච්චිලෙප්පල්ලි	11.20.2024
119	කණ්ඩායම් කාර්මික පුහුණුව ආරි කැටයම් වැඩ	කරච්චි	11.26.2024
120	මාසික පොළ	කරච්චි	11.25.2024
121	කණ්ඩායම් කාර්මික පුහුණුව සාරි, හැට්ට නිර්මාණය	කරච්චි	11.29.2024
122	මාසික පොළ	පූනකරි	12.09.2024
123	අලෙවිකරණ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය	පූනකරි	12.09.2024
124	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	පූනකරි	12.09.2024
125	කණ්ඩායම් කාර්මික පුහුණුව නියපොතු අලංකාරවත් කිරීම	පච්චිලෙප්පල්ලි	12.05.2024
126	කණ්ඩායම් කාර්මික පුහුණුව නියපොතු අලංකාරවත් කිරීම	කණ්ඩාවලෙයි	12.10.2024
127	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	පූනකරි	12.11.2024
128	මාසික පොළ	පච්චිලෙප්පල්ලි	12.02.2024
129	කේෂ්ත්‍ර චාරිකාව අනුරාධපුරය	දිස්ත්‍රික් කාර්යාලය	12.10.2024
130	රසායනාගාර සාම්පල පරීක්ෂා කිරීම	පූනකරි	12.12.2024
131	කණ්ඩායම් කාර්මික පූහුණුව සාරි, හැට්ට නිර්මාණය	දිස්ත්‍රික් කාර්යාලය	12.13.2024

2.6 ජාතික ආපදා සහන සේවා

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සමාජ සේවා හා සමාජ සුභ සාධන අමාත්‍යාංශය යටතේ 1996 වර්ෂයේ පිහිටුවන ලදී. වර්තමානයේ ඒය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ අනුයුක්ත කර ඇත.

අරමුණ :

ව්‍යසන සහන සඳහා වන ජාතික හැකියාවන් දිරිමත් කිරීම මඟින් ආර්ථික යටිතල පහසුකම්වලට අවම කරන ලද මනුෂ්‍ය දුක හා හානි හා අලාභ ආදිය මඟින් තිරසාර සංවර්ධනයේ ජාතික අරමුණට.

අපගේ ප්‍රධාන ක්‍රියාකාරකම්

- දිස්ත්‍රික් මට්ටමින් ආපදා සමයේ තත්වයන් වාර්තා කිරීම
- ව්‍යසන හේතු වෙන් පීඩාවට පත් වූ ජනතාවන් හට කෙටි හා දිගු කාලීන සහන කටයතු.

- ස්වභාවය හා මිනිසුන් විසින් සිදු කරනු ලබන ව්‍යසනයන්ගෙන් ජනතාවන් මුදා ගැනීමේ වැඩ සටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම.
- ව්‍යසනයන් අවම කිරීමට අවශ්‍ය ව්‍යාපෘතින් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම. (අපවිත්‍ර ජලය අපවහනය කර කාණු පිරිසිදු කිරීම)
- පුනරුත්ථාපන හා පුන්ජීවන කටයුතු ක්‍රියාත්මක කිරීම තහවුරු කර සබැඳි අයවලුන් සමඟ ඒකාබද්ධ වී නියෝග නිකුත් කිරීම.
- ස්වභාවය හා මිනිසුන් විසින් බිහි කරනු ලැබූ ව්‍යසනයන්ගෙන් පීඩාවට පත් වූ ජනතාවන්ගේ ආර්ථිකය යථා තත්වයනට ගෙන ඒම සඳහා පුනර්ජීවන හා ප්‍රතිසංස්කරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම. ව්‍යසන තත්වයන් පිළිබඳ තොරතුරු සකස් කිරීම හා නිකුත් කිරීම.
- හදිසි අවස්ථාවන්හි සහන කටයුතු ඒකාබද්ධ කිරීම.

අ. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ සහන සේවා කටයුතු.





2.7 අභ්‍යන්තරවිගණන අංශයේ කටයුතු

දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල අභ්‍යන්තර පාලන හා ක්‍රමවේදයන්ද ඒ හා සම්බන්ධ කටයුතුවල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අරමුණවේ.

අභ්‍යන්තර විගණන අංශය විසින් මෙම වසරේ ප්‍රවර්ධන වසර සඳහා වන වැඩ සටහන් සකස් කර ඇති අතර මාසිකව වසර සඳහා වන වැඩ සටහන් අනුව විගණන වැඩ සටහන් සකස් කර ව අනුව මාසික පෙර වැඩ සටහන් පදනම් කරමින් විගණනය කරන ලදී. 2024 වන වසරේ සම්පූර්ණයෙන් විගණන විමසුම් දහසයක් යවන ලදී. යවන ලද විගණන විමසුම් දොළහකට නිසි කාලයන්හි පිළිතුරු ලැබුණු අතර සුදුසු කටයුතු සිදු කර ඇති බව සඳහන් කළ යුතුයි. වර්ෂය සඳහා වන වැඩ සටහන්හි 89.86% ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණනයට ලක් කරන ලදී. තවද පසු ගිය වසර සමඟ සැසඳීමේදී අභ්‍යන්තර විගණන කටයුතු මෙම වසර ඉතාමත් කාර්යක්ෂමතාවයෙන් යුතුව දක්නට තිබේ

විෂය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල				එකතුව
		කරච්චි	කණ්ඩාවලෙ	පච්චිලෙප්පල්ලි	පුනකරි	
නිරීක්ෂණයන්	02	04	04	03	03	16
ප්‍රතිචාර	02	03	03	02	02	12
පිළිතුරු නොලැබූ නිරීක්ෂණයන්	00	01	01	01	01	04

තවද නිරීක්ෂණ වාර්තා පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවටත් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක අංශයටත් ජාතික විගණන කාර්යාලයටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිවරයාටත් යවා තබනු ලැබුවේය.

අභ්‍යන්තර විගණනවලදී පැන නගින ගැටළු විසඳීම සඳහා වසර තුළ විගණන කළමනාකරණ විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී. මෙම වසරේ රැස්වීම්වලදී, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා පළමු, තෙවන සහ සිව්වන රැස්වීම් සඳහා සූම් තාක්ෂණය (Zoom) මඟින් සහභාගී වූ අතර දෙවන රැස්වීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පෞද්ගලිකව සහභාගී වූ අතර, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයා පළමු, තෙවන සහ සිව්වන රැස්වීම් සඳහා සූම් තාක්ෂණය (Zoom) මඟින් සහභාගී වූ අතර දෙවන රැස්වීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පැමිණ සහභාගී විය. ජාතික විගණන කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරයා පළමු සහ තෙවන රැස්වීම්වලට පැමිණ සහභාගී විය

කළමනාකරණ විගණක කමිටු රැස්වීම		පළමුවන කාර්තුව - 2024	දෙවන කාර්තුව - 2024	තෙවන කාර්තුව - 2024	සතරවන කාර්තුව - 2024
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිලිනොච්චිය	Plan	15.02.2024	16.05.2024	08.08.2024	21.11.2024
	held	06.02.2024	29.05.2024	28.08.2024	18.12.2024
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කරච්චි	Plan	19.01.2024	03.05.2024	01.08.2024	12.11.2024
	held	24.02.2024	03.05.2024	02.08.2024	19.11.2024
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කණ්ඩාවලෙ	Plan	30.01.2024	30.04.2024	30.07.2024	08.11.2024
	held	30.01.2024	30.04.2024	30.07.2024	08.11.2024
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පච්චිලෙප්පල්ලි	Plan	23.01.2024	25.04.2024	25.07.2024	05.11.2024
	held	26.01.2024	25.04.2024	02.08.2024	06.11.2024
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පුනකරි	Plan	26.01.2024	26.04.2024	26.07.2024	07.11.2024
	held	31.01.2024	02.05.2024	31.07.2024	07.11.2024

තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අභ්‍යන්තර විගණක ශාඛා පිහිටුවා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ දැනුවත් කිරීම අනුව විගණන කටයුතු සාර්ථකව සිදු කර ගෙන යනු ලැබේ.

අභ්‍යන්තර විගණක නිලධාරීන් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රියා සැලසුම් නිරීක්ෂණය කර ඒවායේ කාර්යක්ෂමතාවය පිළිබඳ වාර්තා දිසාපති තුමාට ඉදිරිපත් කරනු ලැබේ.

කළමනාකරණ විගණක කමිටු රැස්වීම්වලදී පහත සඳහන් කරුණු පිළිවෙල ශක්තිමත් කිරීමේ අරමුණෙන් හා අවදානම මඟ හැර ගැනීම සඳහාත් සාකච්ඡා කරන ලදී.

- ❖ අභ්‍යන්තර පාලනය හා අවදානම
- ❖ අභ්‍යන්තර විගණනය නිරීක්ෂණය හා විධිමත් කිරීම
- ❖ කේෂ්ත්‍ර සංචාර පිළිබඳ නිරීක්ෂණ
- ❖ ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම් සමාලෝචනය කිරීම.
- ❖ ගත වූ කාලයන්හි රජයේ ගිණුම් කාරක සභාවේ වාර්තා මත වූ ක්‍රියාකාරී ප්‍රගතිය

2.8 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් සේවාවන්

මෙම දෙපාර්තමේන්තුවේ අරමුණ දිවයිනේ භූමි සම්පත විශිෂ්ට ලෙස පරිහරනය කිරීමට දිරිගැන්වීමයි. එකී අරමුණ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය නොයෙක් සේවාවන් දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

අනු අංකය	වැඩ සටහන	ස්ථානය	මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වියදම (රුපියල්)	ළඟා කර ගත් ප්‍රතිශතය
01	ඉඩම් පරිහරණ දත්ත රැස්කිරීම, යාවත්කාලීනකිරීම, දත්ත හුවමාරු කර ගැනීම හා සැලසුම - ඉඩම් පරිහරණ වෙනස්වීම් යාවත්කාලීන කිරීම	දිස්ත්‍රික්කය	54,000	53,938	99.8%
02	පස හා ජල සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම මඟින් අවම පරිහරණයෙන් යුතු කෘෂි ඉඩම්වල නිෂ්පාදනය වැඩි කිරීම.	කරච්චි , පුනකරි	400,000	399,980	99.9%
03	සහභාගීත්ව ප්‍රවේශයක් තුළින් තිරසාර ඉඩම් භාවිතය සඳහා ගම් මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම.	කණ්ඩාවලෙ, පච්චිලෙප්පල්ලි	104,000	103,889	99.8%
04	විශේෂ අධ්‍යයන වැඩ සටහන		100,000	100,000	100%
05	විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය	කරච්චි , කණ්ඩාවලෙ, පච්චිලෙප්පල්ලි පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	52,000	51,971	99.9%
06	ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු රැස්වීම	කරච්චි , කණ්ඩාවලෙ, පච්චිලෙප්පල්ලි පුනකරි ප්‍රාදේශීය	40,000	35,996	89.9%

		ලේකම් කොට්ඨාශ			
07	දිස්ත්‍රික් ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු රැස්වීම	දිස්ත්‍රික්කය	20,000	14,950	74.7%

2.9 කර්මාන්ත කේෂ්ත්‍ර සේවාවන්

- පේෂකර්මාන්ත නිෂ්පාදන හා පුහුණුව
- කොහු නිෂ්පාදන හාපුහුණුව
- සම්ප්‍රදායික කුඩාකර්මාන්ත පුහුණුව
- අනෙක් සම්ප්‍රදායික නොවන කර්මාන්ත පුහුණුව (මහන මැෂින් අළුත්වැඩියා කිරීමේ පුහුණු පාඨමාලාව , බතික් පුහුණු පාඨමාලාව , කඩදාසිවලින් නිම කරන භාණ්ඩ නිෂ්පාදන පුහුණු පාඨමාලාව, තල් කොළ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන පුහුණු පාඨමාලාව, සාරි බ්ලවුස් කටිං භාණ්ඩ නිෂ්පාදන පුහුණු පාඨමාලාව, ඉටි පන්දම්, යෝගට් භාණ්ඩ නිෂ්පාදන පුහුණු පාඨමාලාව

අ. තාක්ෂණික හුවමාරු පුහුණු පාඨමාලා විස්තර මෙසේ.

අංක	පුහුණු පාඨමාලාව	ස්ථානය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	කාලය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වැය විස්තර
1	පොල් කටු අත් කම්	කිලිනගර්	කරච්චි	04.11.2024 - 12.11.2024 (දවස් 07)	19	108560.00
2	ආරි නිර්මාණය	උමයාල්පුරම්	කන්ඩාවලයි	22.11.2024 - 05.12.2024 (දවස් 07))	15	92080.00
03	ආරි නිර්මාණය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පච්චිලයිපල්ලි	පච්චිලයිපල්ලි	06.12.2024 – 15.12.2024 (දවස් 07))	15	94770.00

ආ. ව්‍යවසායයන්ට අයත් සේවාවන්

අනු අංක	විස්තර	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වැය විස්තරය	කාලය
1	ව්‍යවසායකයින් සඳහා උපකරණ සැපයීම. – පළාත් වෙන් කළ අරමුදල්	10	523,126.60	
2	අපගේ පේෂ කර්මාන්ත මධ්‍යස්ථානයේ වීවිං මධ්‍යස්ථානයේ රැකී රක්ෂා ලබාදීම	01		01.10.2024-31.03.2025
3	අපගේ පේෂ කර්මාන්ත මධ්‍යස්ථානයේ වීවිං පුහුණුව ලබාදීම	03		01.02.2024 – 31.07.2024
4	අපගේ කොහු කර්මාන්ත මධ්‍යස්ථානයේ රැකී රක්ෂා ලබාදීම	03		01.01.2024 31.12.2024
5	ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් වෙළඳපොළ අවස්ථා සංවිධානය කෙරේ.	229		01.01.2024 – 31.12.2024
6	නල්ලූර් කන්දස්වාමි දේවාලයේ උත්සවය නිමිත්තෙන් ව්‍යවසායකයින්ට විශේෂපොලක් සංවිධානය කිරීම	01		

7	නත්තල් උත්සවය අපේක්ෂාවෙන් යාපනය සංස්කෘතික ශාලාවේදී වෙළඳ ප්‍රදර්ශනයක් සංවිධානය කර තිබුණි.	01		03.12.2024 – 05.12.2024
8	මූර්ති ප්‍රදර්ශනයක් හරහා ජාතික වශයෙන් ව්‍යවසායකයින්ගේ සහභාගීත්වය.	06		
9	ප්‍රායෝගික දැනුම ඇති අයවලුන්ට ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලබා ගැනීම සඳහා වන අයදුම්පත් මේ වන විට යවා ඇත.	65		01.01.2024 – 31.12.2024
10	අලෙවිකරණය පහසු කිරීම සඳහා ව්‍යවසායකයින්ට පුහුණුව ලබා දීම්.	114		01.01.2024 – 31.12.2024
11	නිෂ්පාදන දර්ශකයේ ඉතිහාසය නිර්මාණය කිරීම	05		01.01.2024 – 31.12.2024

ඇ. කර්මාන්ත පුහුණු මධ්‍යස්ථාන/අලෙවි මධ්‍යස්ථාන

- රෙදි විවීමේ මධ්‍යස්ථානය - ධරම්පුරම්, කන්ඩාවලෙයි
- කොහු කර්මාන්ත මධ්‍යස්ථානය - පුලෝප්පලෙ, පච්චිලෙප්පල්ලි
- ඇසුරුම් මධ්‍යස්ථානය - පල්ලික්කුඩා, පූනකරි
- දේශීය නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවි මධ්‍යස්ථානය - තිරුනගර්, කරච්චි

2.10 "අස්වැසුම" සුභසාධන ප්‍රතිලාභ සේවාවන්

2022 වන වර්ෂයේ අංක 24 දරණ සුභසාධන ප්‍රතිලාභ පනත අනුව 2022 වන වර්ෂයේ ඔක්තෝබර් මස 20 වන දින අංක 2302/23 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශ කරන ලද, අමාත්‍යාංශ අනුමැතිය සහිත ප්‍රතිලාභ දීමනාවන් බෙදා දීමේ නියෝගය සංශෝධනය කර ක්‍රියාත්මක කර 2022 දෙසම්බර් මස 15 වන දින අංක 2310/30 දරණ අති විශේෂ ගැසට් පත්‍ර දැන්වීම අනුව අස්වැසුම ප්‍රතිලාභ වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලැබේ. පීඩාවට පත් වූ, පීඩාවට ලක් විය හැකි, දිළිඳු හා ඉතාමත් දිළිඳු පවුල් ආදි වශයෙන් පියවරයන් 04 ක් යටතේ අස්වැසුම ප්‍රතිලාභ දීමනා ලබා දෙන අතර, ආබාධිත, වැඩිහිටි හා වකුගඩු රෝගීන්ටද සුපුරුදු පරිදි දීමනා ගෙවනු ලබන්නේය.

"අස්වැසුම" ප්‍රතිලාභ වැඩ සටහන සඳහා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ලබා ගන්නා ලද අයැදුම් පත් සංඛ්‍යාව - 314113

➢ *"අස්වැසුම" දීමනා*

අංක	කොට්ඨාශ	ප්‍රතිලාභීන් සංඛ්‍යාව				
		දීමනා වර්ග				සම්පූර්ණ ප්‍රතිලාභීන් සංඛ්‍යාව
		ඉතාමත් දිළිඳු	දිළිඳු	පීඩාවට පත් වූ	අස්ථායී අය	
1	කරච්චි	1868	1492	4162	2245	**9767**
2	කණ්ඩාවලෙයි	675	530	1465	847	**3517**
3	පූනකරි	757	662	1586	791	**3796**
4	පච්චිලෙයිපල්ලි	608	319	1189	490	**2606**
දිස්ත්‍රික් එකතුව		**3908**	**3003**	**8402**	**4373**	**19686**

අස්වැසුම ප්‍රතිලාභීන් අතර වැඩිහිටි දීමනාලාභීන්

අංක	කොට්ඨාශ	වර්ග				සම්පූර්ණ ප්‍රතිලාභීන් සංඛ්‍යාව
		ඉතාමත් දිළිඳු	දිළිඳු	පීඩාවට පත් වූ	අස්ථායී අය	
1	කරච්චි	768	990	206	222	2186
2	කණ්ඩාවලෙයි	277	348	92	99	816
3	පූනකරි	240	304	100	73	717
4	පච්චිලෙයිපල්ලි	253	275	28	51	607
දිස්ත්‍රික් එකතුව		**1538**	**1917**	**426**	**445**	**4326**

2.11 සංස්කෘතික කටයුතු සේවාවන්

01. කලා හා සංස්කෘතික තරඟ

2024.10.10 වන දින වට්ටකච්චි, රාමනාදපුරම් බටහිර AIADMK පාසලේ එළිමහන් ක්‍රීඩාංගණයේදී පැවති සංස්කෘතික උත්සවයකදී, දිස්ත්‍රික් මට්ටමින් ජාතික කලා හා සාහිත්‍ය තරඟයේ ජයග්‍රාහකයින් 53 දෙනෙකුට සහතික සහ තෑග්ග ප්‍රදානය කරන ලදී.



02.කලාකරුවන් ස්වදම්

කලාකරුවන් ස්වදම් වැඩසටහන යටතේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරෙන් කලාකරුවන් 03 දෙනෙකු බැගින් ඔවුන්ගේ නිවෙස්වලට ගොස් තෑගි සහ සිහිවටන ප්‍රදානය කිරීමෙන් ගෞරව කරන ලදී.





03. අදෘශ්‍යමාන උරුම උත්ශ්‍රේණි කිරීම

2024.11.19 වන දින කිලි / තිරුවෙයාරු මහා විද්‍යාලයේ සිසුන් සඳහා අදෘශ්‍යමාන උරුමය වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් පැවැත්විණි.





04. ජාතික සම්මාන

කිලි / රාමනාදපුරම් මහාවිද්‍යාලය රාජකීය නාට්‍ය උළෙලේදී ජාතික සම්මාන හතක් ලබා ගත් අතර 2024.12.01 දින අරලියගහ මන්දිරයේදී ගෞරවයට පාත්‍ර විය.

05. කලාභූෂණම් රාජකීය සම්මානය

කලාභූෂණම් රාජකීය සම්මානය 2023/2024 පූනගරි සහ පලෙයි ප්‍රදේශයේ කලාකරුවන් දෙදෙනෙකුට ගරු කර පිරිනමන ලදී.

06. පාලෙයිතිව් ශාන්ත අන්තෝනි මුනිඳුන්ගේ දේව මෙහෙය

පූනගරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පාලෙයිතිව් ශාන්ත අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයේ වාර්ෂික උත්සවය මෙම මස 1 සහ 2 යන දෙදින මාර්තු මාසයේ පැවැත්විණි. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව රු. 177,000.00 ක අරමුදලක් වෙන් කළේය. මෙම උත්සවය සඳහා මූලික සාකච්ඡා සඳහා ආහාරපාන ලෙස රු. 3850.00 ක් ලබා දුන් අතර, මේ සඳහා බැතිමතුන් 3500 කට අධික පිරිසක් සහභාගී වූහ. සංවිධාන වියදම් ලෙස රු. 173,150.00 ක් සහ ශුද්ධ වූ අන්නම්මාල් ධීවර සමුපකාර සංගමයට සහ පල්ලිකුඩා ධීවර සමුපකාර සංගමයට බෝට්ටු ගාස්තුව ලෙස ලබා දෙන ලදී.

07. මන්නිත්තලෙයි ශාන්ත සෙබස්ටියන් පල්ලියේ වාර්ෂික උත්සවය

පූනගරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති මන්නිතලෙයි ශාන්ත සෙබස්තියන් වාර්ෂික උත්සවය අගෝස්තු මාසයේ 23, 24 සහ 25 යන දිනවල පැවැත්විණි. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව ඉහත දේවාල උත්සවය සඳහා රු. 55,000.00 ක අරමුදලක් වෙන් කළේය. දහස් සංඛ්‍යාත බැතිමතුන් සහභාගී වන මෙම උත්සවය සඳහා සූදානම් කිරීම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ පූනගරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව සිදු කරන ලදී.

2.12 දිස්ත්‍රික් සංගණන හා සංඛ්‍යාලේඛණ සේවාවන්

සංගණන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව වනාහි දිවයිනේ ජාතික සංඛ්‍යා ලේඛණ කාර්යාලය ලෙස පවතින අතර රජයට අවශ්‍ය සංඛ්‍යා ලේඛණ තොරතුරු එක් රැස් කිරීම, ප්‍රකාශ කිරීම ආදියට ප්‍රධාන භාරකරු ලෙස පවතින්නේය.

මෙම දිවයිනේ නොයෙක් ක්ෂේත්‍රයන්හි සමාජ ආර්ථික තත්ත්වය සම්බන්ධව සංඛ්‍යා ලේඛණ තොරතුරු එක් රැස් කිරීම, ප්‍රකාශ කිරීම ආදි එහි කාර්යභාරයට අතිරේකව සංඛ්‍යා ලේඛණ සංඥා ගණනය කිරීම ආදි

සේවාවන් අවශ්‍ය වන සියළුම රජයේ නියෝජිතයන්ටත් වෘත්තීයමය නිළධාරීන් පුහුණු කර සේවයේ යෙදවීමද එහි මෙහෙවර වේ. එයත් සමඟ සංගණන හා සංඛ්‍යා ලේඛණ කරුණු සම්බන්ධයෙන් උපකාර අවශ්‍ය වන නියෝජිතයින්ට එහි තාක්ෂණික අංශය හරහා උපදෙස් සේවාවන්ද ලබාදෙයි.

දෙපාර්තමේන්තුවේ කටයුතු :-

- සාමාන්‍ය වී අස්වැන්න ඇගයීම සඳහා වසරේ කන්න දෙකෙහිම කරනු ලබන දළ මිමි
- කර්මාන්ත, වාණිජ, සේවාවන් පිළිබඳ වාර්ෂික ඇගයීම.
- ශ්‍රී ලංකා වෘත්තීය මිමිම
- වී සංඛ්‍යා ලේඛණ
- ගොඩ ඉඩම් වගාව මහා කන්නය හා යල් කන්නය
- සිල්ලර මිල හා නිෂ්පාදන මිළ
- සත්ව සංඛ්‍යා ලේඛණ
- සාතන ස්ථානයේ මරනු ලබන සතුන්ගේ සංඛ්‍යාව
- ගොඩනැඟිලි සංඛ්‍යා ලේඛණ
- ජන ගහණ සංඛ්‍යා ලේඛණ

කාර්යසාධන කටයුතු :-

2 වන පරිච්ඡේදය යටතට ගැනෙන සියළුම වැඩ සටහන්, 2024 වන වසරේ සාර්ථකව ඉටු කරන ලදී

ලැබුණ මුල්‍ය ප්‍රතිපාදන	:-	රුපියල්. 7,260.934.71
වැය කල මුදල	:-	රුපියල්. 7,133,031.9
ඉතුරු මුදල	:-	රුපියල්. 127,902.81

2.13 සැලසුම් අංශයේ කටයුතු

A. විමධ්‍යගත අය වැය සැලසුම

විමධ්‍යගත අය වැය සැලසුම් වැඩ කටයුතු අංක MF/02/2023 දරණ මුදල්, ආර්ථික ස්ථායිතාව සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ දක්වා ඇති මාර්ගෝපදේශවලට අනුකූලව ව්‍යාපෘති හඳුනාගෙන අනුමත කරන ලද අතර, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදා හරින ලද අතර, ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සෘජුවම සහ අනෙකුත් අදාළ කාර්යාලවල තාක්ෂණික සහාය ඇතිව ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති එවකට සේවය කළ සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන ලද යෝජනා මත පදනම්ව, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ප්‍රතිපාදන නිදහස් කර විමධ්‍යගත අයවැය වැඩ කටයුතු ක්‍රියාත්මක කල ආකාරයටම ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී

ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම මත පදනම්ව ලැබුණු ප්‍රතිපාදන සහ වැඩ වැඩසටහන් පිළිබඳ විස්තර.

අනු අංකය	ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	වැඩ සටහන් ගණන	ප්‍රතිපාදන ගණන (රුපියල් මිලියන)
1	දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය	165	80.00
2	ගරු. එස්. ශ්‍රීදරන් මහතා (පා.නි)	249	119.65
3	ගරු. ජී.ජී. පොන්නම්බලම් (පා.නි)	5	1.10
4	හිටපු පා.නි. එම්.ඒ. සුමන්දිරන්	37	4.935
5	හිටපු පා.නි. සෙ. කජේන්දිරන්	9	5.0
6	හිටපු පා.නි. ද. සිත්තාර්තන් මහතා	12	4.8
7	හිටපු පා.නි ම. විජයකලා මහත්මිය	1	1.0
8	හිටපු පා.නි ඩග්ලස් දේවානන්දා	72	50.0
	එකතුව	**550**	**266.485**

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමේ වැඩ සටහන් විස්තර

අනු අංකය	ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ	වැඩ සටහන් ගණන	ප්‍රතිපාදන ගණන (රුපියල් මිලියන)
1	කරච්චි	266	152.43
2	කණ්ඩාවලෙයි	88	39.395
3	පූනකරි	149	52.6
4	පච්චිලයිපල්ලි	47	22.060
	එකතුව	**550**	**266.485**

B. නාගරික සංවර්ධන හා නිවාස ඉදි කිරීමේ අමාත්‍යාංශය

නිවාස යෝජනා :-

නාගරික සංවර්ධන හා නිවාස ඉදි කිරීමේ අමාත්‍යාංශය විසින් කිලිනොච්චි දිස්ත්‍රික්කයට කලබල හේතුවෙන් පීඩාවට පත් වූ උතුරු නැගෙනහිර පළාත් ජනතාවන්හට සිමෙන්ති ගල්වලින් ඉදි කරන ලද ස්ථිර නිවාස යොජනා ක්‍රමය යටතේ රුපියල් 600000.00 බැගින් වටිනා නිවෙස් 09 ක්ද හා රුපියල් 100000.00 ක් වටිනා නිවෙස් 30 ක්ද රුපියල් මිලියන 35.4 ක වියදමෙන් ඉදි කරන ලදී.

C. නොමිලේ පානීය ජල සම්බන්ධතා වැඩසටහන

නොමිලේ පානීය ජල සම්බන්ධතා වැඩසටහන 2024 දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද අරමුදල් වලින් ආරම්භ කරන ලද වැඩසටහනකි. මෙය කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරෙහිම (කරච්චි, කන්ඩාවලෙයි, පූනගරි සහ පච්ලයිපල්ලි) 2009 ට පෙර අවතැන් වී

නැවත පදිංචි කරන ලද ප්‍රතිලාභීන් තෝරාගෙන, ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය මත අදාළ අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කරන ලද වැඩසටහනකි.

අදාළ ජල සැපයුම් සම්බන්ධතා ව්‍යාපෘතිය සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරට සම්පූර්ණයෙන් රු. 12,492,483.00 ක් වෙන් කරන ලදී.

නොමිලේ පානීය ජල සම්බන්ධතා වැඩසටහන දැනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් චෙක්පතක් ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට යවා ඇති අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිවසකට ජල සැපයුම් සම්බන්ධතාවයක් ලබා දීම සඳහා රු. 28,851.00 කි.

D.; ජල සැපයුම් සම්බන්ධතා ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරක් සඳහා ප්‍රතිපාදන විස්තර

අංක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	තක්සේරුව(දුර) 25M)	සම්පූර්ණ ප්‍රතිපාදන මුදල
1	කරච්චි	204	28,851.00	5,885,604.00
2	කන්ඩාවලෙයි	58	28,851.00	1,673,358.00
3	පූනකරි	89	28,851.00	2,567,739.00
4	පච්චිලෙයිපල්ලි	82	28,851.00	2,365,782.00
	එකතුව	**433**		**12,492,483.00**







E. විදුලි සම්බන්ධතා සංවර්ධන ව්‍යාපෘතිය

2024 දී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද අරමුදල් භාවිතා කරමින් නව විදුලි සම්බන්ධතාව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතර තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය මත ප්‍රතිලාභීන් තෝරාගෙන අදාළ අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගන්නා ලදී.

අනු අංක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිපාදන (රුපියල් මිලියන දුර මීටර 25)	සම්පූර්ණ ප්‍රතිපාදන මුදල
1	කරච්චි	118	46,666.00	5,506,667.06
2	කන්ඩාවලෙයි	40	46,666.00	1,866,666,80
3	පූනකරි	15	46,666.00	700,000.05
4	පච්චිලෙයිපල්ලි	26	46,666.00	1,213,333.33
එකතුව				9,286,667.33

F. සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන

කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය හරහා පූනගරි ප්‍රදේශය සඳහා රුපියල් මිලියනයක් වෙන් කරන ලදී.

ව්‍යාපෘතියේ නම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම සේවා වසම	ව්‍යාපෘති ගණන	සම්පූර්ණ ප්‍රතිපාදන	පිරිවැය
බිත්තර නිෂ්පාදනය	පූනකරි	පල්ලික්කුඩා	1	999,375.00	984,250.00
එකතුව				**999,375.00**	**984,250.00**

නව ගම්මානය "නව රට" ජාතික වැඩසටහන 2024 සඳහා කාර්ය සාධන ගිවිසුම යටතේ කිලිනොච්චි දිස්ත්‍රික් ආංශික තක්සේරු ප්‍රගති වාර්තාව

අංක	වගකිවයුතු දෙපාර්තමේන්තු	දිස්ත්‍රික්කයේ නිශ්චිත ඉලක්කය	අපේක්ෂිත ඉලක්කය	මුළු ඉලක්කය
1	ආර්ථිකය	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් බිහි කිරීම;	21	24
		කාර්මික හා අපනයන ව්‍යාපෘති සංවර්ධනය කිරීම	06	06
2	සමාජය	පාසල් නොයන දරුවන් පාසල්වලට ඇතුළත් කිරීම;	95	82
		මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමෙන් මිදීමට පුනරුත්ථාපනය	77	53
		පවුල් නීති විරෝධී මත්පැන් වර්ග විකිණීමෙන් නිදහස් කිරීම.	20	09
3	දිළිඳුකම තුරන් කිරීම	ආර්ථික අර්බුදයෙන් පවුල් මුදා ගැනීම	97	103
4	සෞඛ්‍යය හා පෝෂණය	අඩු ආදායම්ලාභී පවුල්වල ගැබිනි මව්වරුන් පෝෂණයෙන් පිරුණු අය බවට පත් කිරීම.	70	74
		මන්දපෝෂණයෙන් පෙළෙන අය පෝෂණය කිරීම	61	69
5	කෘෂිකර්මය	තිරසාර ගෙවතු නිර්මාණය කිරීම	2480	2373
6	පරිසරය	වන වගා සැලැස්ම ක්‍රියාත්මක කිරීම	04	01
		එකතුව	2931	2794

2.14 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සේවාවන්

